# සංචාරයක අරමුණ වන්නේ අනුන්ගේ කුණු කසල වල දුගන්ධය ආශ්වාදය කිරීමද?

තමා ජීවත් වන පරිසරයටම හිර නොවී, පිට ප්‍රදේශයන් තුළ මෙන්ම පිට දේශයන් තුළද, මිනිස් සංක්‍රමණයන් සිදු වීම ඇති වූයේ ලොව බිහි වූ දා පටන්ම ය. අද දියුණුවට පත් මිනිසා එයිනුදු නොනැවතී පිටසක්වල තරණය කිරීම පවා පටන් ගෙන බොහෝ කල්ය. පුරාණයේ මෙන් නොව, නවීන ලෝකයේ රටවල් තම දේශපාලනික සහ ආර්ථික අනන්‍යතාව පාලනය කිරීම සඳහා පනවා ඇති වීසා ගමන් බලපත්‍ර ක්‍රමවේදය නිසා මෙම සංක්‍රමණයට නොයෙකුත් බාධක පැන වී ඇත. ශ්‍රී ලංකාවේ සමහර කාන්තාවන් මෙම බාධකයන් අභිබවා යාමේ ක්‍රියාදාමයක් ලෙස පිටරැටියන් සමඟ විවාහ වන බවට බර්ලීනයේ සංචාරයකට පැමිණි හේමමාලා හේරත් නැමැති කාන්තාවක් ඕස්ට්‍රේලියාවේ පල වන ශ්‍රී ලංකා පුවත් පතකට වාර්තා කර තිබුණි.

සමහර සංචාරකයෝ, ඇවිදින්නන් වාලේ ඇවිදිති. සමහරු ලොව විසිතුරු දේ දැක බලා ගැනීමේ අරමුණ ඇතිව ඇවිදිති. තවත් සමහරු දැනුම් සම්භාරයක් ලබා ගැනීමේ අරමුණින් සංචාරය කරති. මේ අතර අනුන්ගේ කුණු කසල වල දුගන්ධය ආශ්වාදය කිරීමේ අභිප්‍රායෙන් සංචාර කරන්නෝද ඇති බව ඉහත කී පුවත්පත් වාර්තාව සනාත කරයි.

අවුරුදු දෙදහස් ගණනකටත් ඉපැරණි විශ්ව ගනයේ ලා සැළකෙන භාෂාවක මහිමයන් කියා පාමින් විවිධ ආකාරයේ භාෂා නිර්මාණයන් බිහි කරන ප්‍රභූ ගත්කතුවරයන්, ප්‍රබන්ධකයින් සිටින ශ්‍රී ලාංකිකයින් අතර ඉතා අශෝබනවචනඑකතුවකින් ප්‍රසිද්ධියක් ලබා ගැනීමට උත්සාහ දරන අය සිටීම එම ප්‍රභූවරුන්ට මෙන්ම එම රටට, එම භාෂාවටද විශාල හානියක් සිදු කරයි. පුද්ගලයෙකු හෝ නගරයක් අපකීර්තියට පත් කිරීමෙන් තමාට හෝ තමා වාසය කරන නගරයට කීර්තියක් ලබා ගැනීමට හැකි වේ යැයි සිතීම අනුවණකමකි.

නවීන ලෝකයේ ඇති වූ කාර්මික විප්ලවයේ ප්‍රතිලයක් වශයෙන් බිහි වුණු ගමන් පහසුකම්, රූපවාහිනිය, දුරකථන, අන්තර්ජාලය වැනි මිනිස් සම්බන්ධීකරණ උපකරණ හේතුවෙන් අද ලෝකය කුඩා ගමක් බවට පත් ව ඇත. මේ හේතුවෙන් පිට දේශයන් අතර ඇති වන විවාහයන් ද වැඩි වී ඇත. දේශයන් අතර හෝ එක් දේශයක් තුළම ඇති වන විවාහයන්ගේ සාර්ථක මෙන්ම අසාර්ථක විවාහයන් ද එමටය. එනමුත් අසාර්ථකත්වයක් පතාගෙන විවාහ දිවියට අතුළු වන කෙනෙකු ලෝකයේ නැත. විවාහ දිවියට ඇතුළු වන ඕනෑම කෙනෙකු තම සහකරුවා හෝ සහකාරිය තුළින් තම ජීවිතයට ආලෝකයක්, අත්වැලක් බලාපොරොත්තුවෙන් එම විවාහයට ඇතුළු වේ.

එසේ නම් යුරෝපීයයන් සරණ පාවා ගත් ශ්‍රී ලාංකික කතුන් තුළ ද එවැනි බලාපොරොත්තු ඇති වීම අරුමයක් නොවෙයි. වීසා තහංචි කෙතරම් තිබුණත්, සත් සමුදුර තරණය කරන්නට අවශ්‍ය උදවියට ඒ සඳහා නොයෙකුත් මාර්ග තිබිය දී ශ්‍රී ලාංකික කාන්තාවන් වීසා බලපත්‍ර සඳහාම පමණක් පිටරැටියන් හා විවාහ වන බවට නගන චෝදනාව, තම උපන් දේශයේ සහෝදරියන් හෝ දූවරුන් දෙස ද්වේශයෙන් තොරව, ඒ දෙස සුබවාදීව බලන කිසිවෙකුට එය පිළි ගත නොහැක. කාන්තාවක් විවාහ වන්නේ කුමන අරමුණක් ඇතිව දැයි තේරුම් ගැනීමට කාන්තාවකට නොහැකි වීම කෙතරම් කණගාටුදායක ද?

ආදී යුගයේ බිහි වුණු නොයෙකුත් සමාජ රටාවන් තුළ පිරිමින් විසින් ස්ත්‍රීන් ඉතාමත් පහත් තත්ත්වයකට ඇද දා තිබුණි. මෙය හුදෙක්ම පැවතියේ නූගත් සමාජයන් තුළය. එසේම පුරාණයේ ලොව නොයෙකුත් විස්කම් පෑ ප්‍රබල ස්ත්‍රීන් ද සිටි බවට ඉතිහාසය සාක්ෂි දරයි. එයින් අදහස් කෙරෙනුයේ ස්ත්‍රීන් එක හා සමානව පිළිගත්, උගත් පුරුෂයන් ද එම යුග වල ජීවත් වූ





> සමහර සංචාරකයෝ, ඇවිදින්නන් වාලේ ඇවිදිති. සමහරු ලොව විසිතුරු දේ දැක බලා ගැනීමේ අරමුණ ඇතිව ඇවිදිති. තවත් සමහරු දැනුම් සම්භාරයක් ලබා ගැනීමේ අරමුණින් සංචාරය කරති. මේ අතර අනුන්ගේ කුණු කසල වල දුගන්ධය ආශ්වාදය කිරීමේ අභිප්‍රායෙන් සංචාර කරන්නෝද ඇති බව ඉහත කී පුවත්පත් වාර්තාව සනාත කරයි.

බවයි. අද දියුණු ලෝකයේ කාන්තාවන්, පිරිමින් හා සම සමව සමාජ ප්‍රවර්ධනයට දායක වෙමින් සිටියි. තවමත් ස්ත්‍රිය වහලියක් කොට සළකන පිරිමින් සිටින සමාජයන් නැතිවාම නොවෙයි. සමාජ බලපෑම් නිසාම, තම මියගිය පුරුෂයා දැවෙන ගිනි සෑයට පැන සිය දිවි නසා ගැනීමට තැත් කළ ස්ත්‍රීන් ගැන අදත් ඉන්දියාවේ සමහර ගම්බද ප්‍රදේශ වලින් වාර්තා වෙයි.

පිට දේශයක වාසය කළත් ශ්‍රී ලංකාවේ උන්නතිය සඳහා කෙරෙන වැඩ කටයුතු වලදී බර්ලීනයේ වෙසෙන ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් කෙරෙන සේවය අති විශාලය. කෙතරම් සැප සම්පත් ඇතිව ජීවත් වුවත්, තම මව් රට අමතක නොකර තමන් උපන් දේශයේ සංස්කෘතියට මුල් තැන දෙමින්, එය නගා සිටුවන්නට තමන්ට හැකි සෑම කාලයක්ම වැය කරන මොවුන් තම දරු දැරියනට පමණක් නොව ජර්මන් දරුවනට ද ප්‍රයෝජනවත් වන පරිදි, ශ්‍රී ලාංකික නැටුම් පංති, භාෂා පංති, පුස්තකාල යනාදිය පවත්වා ගෙන යෑමට සහ අනෙකුත් ජාතික සහ සංස්කෘතික වැඩ සටහන් පැවැත්වීමේදී පෙරමුණ ගෙන කටයුතු කිරීම දැකිය හැකිය.

උක්ත ලිපියෙහි ඇය දක්වා ඇති කරුණු ඇයගේ මානසික තත්වයේම සිටින, අනෙකුත් කාන්තවන් දෙස ද්වේශ සහගතව බලන කෙනෙකු හා එක් වී ගොතන ලද කතා පුවතක් බව ඒ පිළිබඳව සොයා බැලීමේදී දැන ගන්නට ලැබිණ. එවැනි තත්වයන් ලෝකයේ ඕනෑම තැනෙක මෙන්ම බර්ලීනයේ ද සිදු විය හැකි මුත් ඈ විසින් කළ යුතුව තිබුණේ ඒවාට සිනාසී, පහර ගැසීම නොව ඒ පිළිබඳව කතිකාවතක් සම්පාදනය කර කාන්තාවන්ට වේදිකාවක් තනා දීමය. එබැවින් ඈ කළ මෙම ක්‍රියාව කෙතරම් නොවටින්නේදැයි කියන්නට මේ දරන උත්සාහය බර්ලීනයේ වෙසෙන කාන්තාවන්ට පමණක් නොව ඕස්ට්‍රේලියාව ද ඇතුළුව ලෝකයේ නන් දෙස ජීවත් වන කාන්තාවන් උදෙසාය.





බටහිර සහ නැගෙනහිර වශයෙන් වෙන් වෙන්ව පාලනය වුණ බර්ලීන් නගරය එක්සත් ජර්මනිය තුළ එක නගරයක් බවට නැවත පත් වූවාට පසුව ඇති වුණ නව නගර ප්‍රතිසංස්කරණය තුළ, ලොවේ නොයෙකුත් රටවල සිටින දක්ෂතම ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ නවීනතම නිර්මාණයන් දැකිය හැකි වන අතර, ලෝක යුද්ධයන් දෙකටම හේතු සාධක වූ නගරයත් ලෙස සැළකෙන බර්ලීනය, ලෝක ඉතිහාසයට එක් වී ඇති වටිනා පෞරාණික නගරයකි.

බර්ලීනයේ නැරඹිය හැකි දේ එමටය. කෞතුකාගාර, නෘත්‍ය ශාලා, බර්ලීනයේ අනන්‍යතාව තහවුරු කරන බර්ලීන් ස්මාරකය මෙන්ම, නැගෙනහිර සහ බටහිර එකම රටක් කරමින් බිඳ හෙළූ බර්ලීන තාප්පයේ කොටස් ඇතුළු විවිධ දෑ වලින් සමන්විතය.

මෙම නගරය තුළ ඇති දේශපාලනික මෙන්ම සංස්කෘතික වටිනාකමින් හෙබි ඓතිහාසික ස්ථානයන් නැරඹීමට ඔබට අවශ්‍ය සියළු තොරතුරු සැපයීමටත්, ඒ සඳහා ඔබ දැනුවත් කිරීමටත් බර්ලීන් පාඨක පර්ෂදය සමඟ එක්ව සිටින කාන්තාවෝ ඉතා කැපවීමෙන් එම මෙහෙවර කරනු ලබන බව ලොව පුරා විසිර සිටින සන්නස පාඨකයන්ට දන්වා සිටින්නටද මෙය අවස්ථාවක් කර ගනිමි.

රොයිස්ටන් ප්‍රනාන්දු

- බර්ලීන් පාඨක පර්ෂදය -

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම
සවස 6 සිට 8 දක්වා
FM 88.6